සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන
"අදිති"

14

පැය 01 යි

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයකට අදාළ නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

- **අංක 1 සහ 2 ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට, ගැළපෙන කොටස තෝරන්න.**

01.



(1)  (2)  (3) 

02. පහත රූපසටහන පිළිබඳ ව නිවැරදි ම ප්‍රකාශය කුමක් ද?




(1) ජෝගුවක් හා පාපිස්නාවක් ඇත.

(2) පුටුවක් ඇති අතර ජල කරාමයක් නැත.

(3) ශීතකරණය මත පලතුරු වට්ටිය ඇත.

03. පහත දී ඇති රූපවලින් එක් රූපයක් අනෙක් රූප දෙකට වඩා වෙනස් ය. එම වෙනස් රූපය තෝරන්න.


(1)


(2)


(3)

- **දී ඇති කවිය ඇසුරෙන් 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

දෙබර මුළක් ගල් වැදී සැලෙන සේ
එපා පුංචි ළමයින් පොර කන්නට
පේළි ගැසී බසයට නැග ගත් විට
මුතු ඇමුණුවා වාගේ මුතු පොටකට

04. පොරකමින් සිදු කරන්නට එපා යැයි කවියෙහි දැක්වෙන්නේ,

(1) දෙබරයට ගල්ගැසීම (2) මාලයට මුතු ඇමිණීම (3) බසයට නැග ගැනීම

05. ගල් වැදී සැලෙන්නේ,

(1) මුතු පොටය. (2) දෙබර මුළය (3) පුංචි ළමයින් ය

06. පවිත්, සසේන, නදුල හා පමුදු යන සිසුන් සිව්දෙනා අතුරෙන් දෙදෙනෙකු තෝරා ගැනීමට ගුරුතුමියට අවශ්‍ය වී තිබේ. ඇයට ඒ සඳහා එකිනෙකට වෙනස් තේරීම් කළ හැකි ආකාර කීයක් තිබේද?

(1) 6 (2) 4 (3) 24


07. පළමු හා දෙවන හිස්තැන සඳහා පිළිවෙළින් වඩාත් සුදුසු වචන යුගලය තෝරන්න.
එකිනෙකා වෙත ............. දක්වමින් උදවු උපකාර කිරීමෙන් ලෝකය වඩාත් ........... තැනක් බවට පත් කර ගත හැකිය.

(1) ආදරය ,දිළිඳු (2) කරුණාව, සුන්දර (3) සෙනෙහස, රුදුරු

08. පාසල් නිවාඩු දිනක උදෑසන මඩොල් දූව පොත කියවීමට පටන් ගත් ශෙරාන් 25 වැනි පිටුවේ සිට 50 වෙනි පිටුව තෙක් කියවූ බව හවස පැවසුවේය. ඔහු එදින කියවූ පිටු ගණන වූයේ,

(1) 25 කි. (2) 26 කි. (3) 27 කි.

09. දී ඇති පතොරම්වලින් දෙකක් එකම ඝනකයකට අයත්ය. එම පතොරම් දෙක වන්නේ.




(A) (B) (C)

(1) A B (2) B C (3) A C

- සංඛ්‍යා යොදා ඇති රටා හඳුනාගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

10.





(1) 13 (2) 23 (3) 16




11. 23, 55, 28, 50, 33, 45,...... , ......

(1) 38, 35 (2) 40, 40 (3) 38, 40

12. ලීයෙන් කපාගත් ඝනවස්තු කිහිපයක් තබා ඇති අයුරු පහත දැක්වේ.



ඉහත ඝනවස්තු දෙස ඉහළින් බැලූ විට පෙනෙන අයුරු වන්නේ,

(1)  (2)  (3) 

13. කෙසෙල් ගෙඩියක් අතින් ගත් වඳුරෙකු ඡායා රූපයකට හසුවූයේ මෙලෙසිනි.



මෙම ඡායාරූප ශිල්පියා වඳුරාගේ ඉරියව් වෙනස් නොකර අනෙක් පසින් ඡායා රූපය ලබා ගත්තේනම් එය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,


(1)


(2)


(3)

14. මෙම සංවාදය කියවා බලන්න. එහි පියවර අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - පාසල් පුස්තකාලයෙන්
B - හ්ම් .... ගොඩක් ලස්සනයි.
C - ලේඛිකාවක් , සිබිල් නැන්දා
D - ඔය පොත ලස්සනද ?
E - කොහෙන්ද ගත්තෙ ?
F - කවුද ලේඛකයා?

(1) FCDABE (2) DBEAFC (3) CDEABF

15. A, B, C, D ලෙස නම් කළ සිසුන් සිව්දෙනකු බංකුවක වාඩි වී සිටිය හ. ඔවුන් සිටි ස්ථානය වෙනස් කරමින් අසුන් ගත්තේ B හා D එක ළඟ නොසිටින ලෙස ය. ඔවුන් එසේ ස්ථාන වෙනස් කරගනිමින් අසුන් ගත හැකි උපරිම ක්‍රම කීයක් පවතීද?

(1) 12 (2) 14 (3) 24

16. සිසුන් කණ්ඩායමක් චාරිකාවකට සහභාගි වූහ. ඔවුන් දෙදෙනා බැගින් හෝ තිදෙනා බැගින් හෝ හතරදෙනකු බැගින් හෝ පස්දෙනකු බැගින් හෝ හයදෙනකු බැගින් හෝ ඉතුරු නැතිව කණ්ඩායම් කළ හැකිවිය. චාරිකාවට සහභාගි වූ සිසුන් ගණන වන්නේ,


(1) 72 (2) 24 (3) 60

17. එක ළඟ ඇති සංඛ්‍යා පහක එකතුව 25 කි. එහි විශාල ම සංඛ්‍යා තුනෙහි එකතුව 18 කි. කුඩාම සංඛ්‍යා තුනේ එකතුව වන්නේ,


(1) 12 (2) 15 (3) 18

18. සිද්ධියකට අදාළ රූප පහක් පහත දී ඇත. එය කිසියම් අනුපිළිවෙළකට සැකසූ විට ක්‍රියාවලියක් නිරූපනය වේ. එහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර කුමක්ද?


A


B


C


D


E


(1) EABDC (2) CABDE (3) EADBC

19. උදෑසන 5 ට 10 ක් ලෙසින් පැතුම් ඔරලෝසුවක සීනුව සටහන් කර තැබුවේ උදෑසන අවදි වීමේ අරමුණ ඇතිවය. එය ඩිජිටල් ඔරලෝසුවේ පෙන්නුම් කරන නිවැරැදි ක්‍රමය වන්නේ,


| (1) | (2) | (3) |
|---|---|---|
| **17 : 10** | **05 : 10** | **04 : 50** |

- නොගැළපෙන ලෙස ඇඳ ඇති රූපය වන්නේ,


20.



(1)




(2)



(3)


21.



(1)




(2)



(3)

22. ලීයෙන් සාදන ලද විශාල ඝනකයක් සමාන කුඩා ඝනක 27 ක් ලැබෙන සේ කපා ඇති අයුරු කඩ ඉරිවලින් ඇඳ පහත දක්වා ඇත.



පෙන්වා ඇති පරිදි එය මුලු මුලු යාවෙන පරිදි ඉරි දිගේ නැවත කැපූ විට කොටස් හතරකට වෙන් වෙන කුඩා ඝනක කීයක් තිබේ ද?

(1) 1 යි. (2) 3 යි. (3) 15 යි.

23. පහත ඡායාරූපය ගෙන ඇත්තේ දවසේ කුමන වේලාවක දැයි දී ඇති පිළිතුර අතුරින් තෝරන්න.



(1) මධ්‍යාහ්න 12.30 ට පමණ
(2) පෙ.ව 6.30 ට පමණ
(3) ප.ව 3.30 ට පමණ

24. ප්‍රශ්න 40 ක් අසනු ලබන දැනුම මිනුම තරගයකදී නිවැරදි පිළිතුර සපයන සෑම විටක දී ම නිවැරදි පිළිතුරක් වෙනුවෙන් ලකුණු 3 ක් ලබා දෙන අතර වැරදි පිළිතුරු ලබා දෙන සෑම ප්‍රශ්නයක් වෙනුවෙන් ලකුණු 2 ක් අඩු කරනු ලැබේ.
ප්‍රශ්න 32 කට නිවැරදි පිළිතුරු ලබාදුන් අයෙකුට ලැබෙන ලකුණ වන්නේ,

(1) 80 යි. (2) 96 යි. (3) 64 යි.

25. නොගැළපෙන පද යුගලය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) සමචතුරස්‍රය - ඝනකය (2) ත්‍රිකෝණය - චතුස්තලය


(3) වෘත්තය - ගෝලය

26. සරත්ගේ පුතා යෙනුල්ය. යෙනුල්ගේ අයියා දම්සිත්ය. සරත්ගේ අයියා හා දම්සිත් අතර ඇති ඥාති සම්බන්ධතාවය කුමක්ද?

(1) ලොකු තාත්තා සහ පුතා (2) අයියා සහ මල්ලී

(3) සීයා සහ මුණුපුරා

27. වට රවුමකට ඇතුළුවන රියදුරෙකුට දුර සඳහන් වන පුවරුව වම්පසින් ප්‍රදර්ශනය විය.




ඒ අනුව ජය ශ්‍රී මහා බෝධිය අසල සිටි අයෙකු වටරවුම හරහා දුම්රිය ස්ථානයට යාමට ගමන් කළ යුතු දුර වන්නේ,

(1) $6\ km\ 80\ m$ (2) $5\ km\ 180\ m$ (3) $4\ km\ 895\ m$

- **මෙම තොරතුරු ඇසුරෙන් 28, 29 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

නිපුන්, කපිල, සදිස එකම පන්තියේ මිතුරන් වෙති. ඔහු වෙන් වෙන් වශයෙන් එක් භාෂාවක් හොඳින් හසුරුවති. ඔවුන්ගෙන් එක් අයෙකුට ඩ්‍රෝන යානයක් ද, තවත් අයෙකුට ජංගම දුරකථනයක් ද එක් අයකුට රොබෝ යන්ත්‍රයක් ද ඇත.

- නිපුන් ඉංග්‍රීසි භාෂාව හොඳින් හසුරුවයි.
- ජපන් භාෂාවට දක්ෂ දරුවාට ඩ්‍රෝන යානයක් නැත.
- කපිල ජපන් භාෂාවට දක්ෂ නැත.
- දෙමළ භාෂාවට දක්ෂ සිසුවාට ඇත්තේ ජංගම දුරකථනයකි.


28. ඩ්‍රෝන යානය ඇති සිසුවා කවුද?

(1) නිපුන් (2) කපිල (3) සදිස

29. කපිල දක්ෂ භාෂාව කුමක්ද?

(1) ජපන් (2) ඉංග්‍රීසි (3) දෙමළ

30. රූපයේ ඇති ගඩොල්වලින් $\frac{1}{4}$ ක් ප්‍රයෝජනයට ගත් පසු ඉතිරි ගඩොල් ගණන කීය ද?



(1) 12 (2) 18 (3) 15


31. මිනිත්තු 20 කට වරක් නාද වන ඔරලෝසුවක් පළමු වරට නාද වූයේ පෙ.ව 7.00 ට ය. එය පෙ.ව 8.10 වන විට නාද වූ වාර ගණන කීය ද?

(1) 4 (2) 3 (3) 5


32. තම්බපණ්ණි විදුහලේ සියලුම ළමුන් ගණිත විෂයට දක්ෂය. ගාමිණි ගණිත විෂයට දක්ෂ සිසුවෙකි. ඒ අනුව ගාමිණී තම්බපණ්ණි විද්‍යාලයේ ශිෂ්‍යයකුය, යන ප්‍රකාශය

(1) නිශ්චිතව කිව නොහැකි ය. (2) සත්‍යය (3) අසත්‍යය

33.



සමචතුරස්‍රාකාර කඩදාසියේ තද කළු වර්ණයෙන් ඇඳ ඇති රේඛාව මත ත්‍රිකෝණාකාර කඩදාසියේ තද කළු වර්ණයෙන් ඇඳ ඇති රේඛාව පිහිටන සේ කඩදාසි දෙක අලවාගත් විට පිහිටන ආකාරයක් නොවන්නේ,



(1) (2) (3)

34. අධික අවුරුද්දක් නොවන වර්ෂයක මාර්තු මාසයේ 4 වෙනිදා බදාදා ය. එම මාසයට ඇති බදාදා දිනයන්ගේ එකතුව වන්නේ,

(1) 58 (2) 85 (3) 75

35. 264, 238, 217, 295 යන සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට ලියූ විට ලැබෙන දෙවන සංඛ්‍යාවේත් සිව්වන සංඛ්‍යාවේත් මැද ඉලක්කම් පිළිවෙළින්,

(1) 9, 6 වේ. (2) 6, 3 වේ. (3) 6, 1 වේ.


36. 2022 වර්ෂයේ අගෝස්තු 1  සඳුදා උපන් දිනය සැමරූ දෙනුවන් 2023 වර්ෂයේ උපන් දිනය සමරන දවස කුමක්ද?

(1) අඟහරුවාදා    (2) බදාදා    (3) බ්‍රහස්පතින්දා

37. පොත් දෙකක් රු. 150.00 කි. තීන්ත පෑනක් පොතකට වඩා රු.50.00 කින් මිල වැඩිය. තීන්ත පෑනක මිල කීයද?

(1) රු. 125.00    (2) රු. 200.00    (3) රු. 100.00


- **38, 39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



රු.100.00



රු.145.00



රු. 90.00


38. පිඟානක මිල වන්නේ,

(1) රුපියල් 25.00    (2) රුපියල් 55.00    (3) රුපියල් 35.00

39. හැන්දක් මිලට ගෙන රුපියල් 100.00 ක් දුන් විට ලැබෙන ඉතුරු මුදල වන්නේ,

(1) රුපියල් 65.00    (2) රුපියල් 25.00    (3) රුපියල් 75.00

40. මෙම රූපයේ ඇති මුළු සමචතුරස්‍ර ගණන කීයද?



(1) 12 යි.

(2) 9 යි.

(3) 10 යි.